අද
city edition
2023-12-12
අඟහරුවාදා
012 / 244
RS.40/=

# වැට් බද්ද සම්මතයි

**පක්ෂව 100**

**විපක්ෂව 55**

>>P2



# 2024 ජනවාරි 01දා සිට 18%ක වැට් එන භාණ්ඩ හා සේවා

ආහාර, ආහාර නොවන, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා, සාමාජයීය කරුණු සහ වෙනත් වැට් බදු අය වෙයි

ධාන්‍ය මගින් නිපදවන ආහාර නිෂ්පාදන, පොල් කිරි, පොල්තෙල්, ඇස් කණ්ණාඩි, බලශක්තිය ඉතිරි කරන බල්බ, ජංගම දුරකථන, එතිල් ඇල්කොහොල්, දේශීය කිරි නිෂ්පාදන, පොත්, සඟරා, පත්‍රිකා හෝ වාර සඟරා, ටින් කළ මාළු, සිතුවම් නිර්මාණ අලෙවි කිරීමේ ඇතුළු භාණ්ඩ හා සේවා රැසකට වැට් බදු

>>P2

## කුකුළු මස් මිල යළි නගී

තොග මිල අද සිට රු. 1,230 - 1,250 දක්වා ඉහළට



>>P2

## ආපදා අවදානම නිසා හල්දුම්මුල්ලේ පාසල් 3ක් වැසෙයි

**සිසුන් හා ගුරුවරු වෙනත් පාසල්වලට**

● හල්දුම්මුල්ල - සමන් පාලිත නානායක්කාර

අයහපත් කාලගුණයෙහි බලපෑමෙන් හල්දුම්මුල්ල කොට්ඨාසයේ පාසල් තුනක් වසා දමා ඇතැයිද ඒ ඒ පාසල්වල ඉගෙනුම ලබන දූ දරුවන් අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට කටයුතු කර ඇති බවද හල්දුම්මුල්ල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ නිලානි ධම්මිකා මහත්මිය ඊයේ (11දා) පැවසුවාය.

බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ධම්මික හේරත් මහතාගේ උපදෙස් අනුව මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන අතර, නාය යාමට ගොදුරු වීම නිසා වැසී ගිය කැලිපානාවෙල විදුහලේ දූ දරුවන් වැල්ලවාය ගම්පහ විදුහලටද, ගල් පෙරළීමේ අවදානමක් හේතුවෙන් වසා දමා ඇති බ්ලැක්වුඩ් විදුහලේ දූ දරුවන් හල්දුම්මුල්ල දෙමළ මහා විදුහලටද, ගොඩනැගිලි කඩාවැටීමේ අවදානම හේතුවෙන් වසා දැමූ මාලදොල විදුහලේ දූ දරුවන් හරංකහව විදුහලටද යොමු කර අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවද ඒ මහත්මිය පැවසුවාය.

එම පාසල් නියමිත තැන්වලම පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදෙන තෙක් තාවකාලික ස්ථානවල ඒ ඒ පාසල්වල ගුරු මණ්ඩල මගින්ම දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කිසිදු බාධාවකින් තොරව කරගෙන යාමට අවශ්‍ය කටයුතු යොදා ඇති බවද කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ නිලානි ධම්මිකා මහත්මිය වැඩිදුරටත් පැවසුවාය.

## 24 වැනි ජනමාධ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල අද

● නවෝද්‍යා පවනි

ශ්‍රී ලංකා කර්තෘ සංසදය සංවිධානය කරන 24වැනි ජනමාධ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල අද (12දා) පැවැත්වේ. ගල්කිස්ස මහ හෝටලයේ පැවැත්වෙන මෙම සම්මාන උළෙලේදී ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් 5 දෙනෙකු ඇගයීමට ලක් කිරීමට නියමිතය.

ඒ අනුව එච්.එල්.ඩී. මහින්දපාල, සින්න තුරෙයි තිලෙයි නාදෙන්, එම්.ඒ.එම්. නිලාම් යන මාධ්‍යවේදීන් සහ සීතා රංජනී මාධ්‍යවේදිනිය ඇගයුම් සම්මානයෙන් පිදුම් ලැබීමට නියමිතය.

## මෙවර සහල් අස්වැන්න මෙට්‍රික් ටොන් 2,750,000ක්

පරිභෝජනය සඳහා වසරකට අවශ්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,540,000ක්

නමුත් සහල් ආනයනය කිරීමට සිදුවෙලා

- කෘෂිකර්ම ඇමති කියයි



>>P2

## රු. 20,000ක් ඉල්ලා රාජ්‍ය සේවක වැඩවර්ජනය අද

සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහනය වර්ජනයට නෑ

>>P2

## චෙක්පත් නඩුවෙන් ප්‍රියමාලි නිදහස්

>>P3

## කන්දකාඩු පුනරුත්ථාපන කඳවුරෙන් රැඳවියන් 50ක් පැනලා

රැඳවියන් 23ක් පුලස්තිපුර පොලීසියට භාරවෙලා

>>P7

## "රනිලුයි සජිතුයි කිසිම දවසක එකතු වෙන්නේ නෑ"



කප්පම් ගන්න ජඩ මාධ්‍ය බොරු ප්‍රචාර ක්‍රියාත්මක කරන්න එපා

- විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

● දිනේෂ් සමරකෝන්

රනිල් වික්‍රමසිංහ මහතා සහ තමා කිසි දිනෙක එකතු නොවන බවත්, කප්පම් ලබාගන්නා 'ජඩ මාධ්‍ය' මෙවැනි අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙස ප්‍රකාශ කරන බවත් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේදී ඊයේ (11දා) ප්‍රකාශයක් කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"මම මාධ්‍ය කියන වචනය පාවිච්චි කරන්න කැමති නෑ. මේ ඇත්තටම ජඩ, බොරු, ප්‍රචාරක කටයුතු කරන ආයතන කිහිපයක් එකට එකතුවෙලා, ආණ්ඩුවෙන්ද කොහෙද කප්පම් අරගෙන ඔවුන් කියාගෙන යනවා රනිලුයි සජිතුයි එකතු වෙනවා කියලා. රනිලුයි සජිතුයි කිසිම දවසක එකතු වෙන්නේ නෑ. ඒක මම මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරනවා. දැන්වත් කප්පම් ගන්න ජඩ මාධ්‍ය මේ බොරු ප්‍රචාර ක්‍රියාත්මක කරන්න එපා කියලා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා."

## ඇමති ආරක්ෂක සැරයන්ගේ පිස්තෝලය, උණ්ඩ 24ක් හා ඇඳුම් බෑගය පිටකොටුවේදී සොරාගෙන

>>P6

මෙදා නත්තලට ගමටම තෑගි දෙන්න
සුපිරි තෑග්ගට
රුපියල් කෝටි 41ක්




Mega POWER
මෙගා පවර්
අද බිහිවන සුපිරි කෝටිපතියා ඔබ විය හැකියි ?
ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board

## කාලගුණය

උපරිම උෂ්ණත්වය
**33°C** රත්නපුරය

අවම උෂ්ණත්වය
**13°C** නුවරඑළිය

වැසි තත්ත්වය
උතුරු/ උතුරුමැද/ නැගෙනහිර/ ඌව/ බස්නාහිර පළාත් හා ගාල්ල/ මාතර/ හම්බන්තොට/ නුවරඑළිය/ අම්පාර දිස්ත්‍රික්කවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මීදුම් තත්ත්වය
බස්නාහිර/ සබරගමුව/ මධ්‍යම/ දකුණු හා ඌව පළාත්වල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් තත්ත්වයක් පැවතිය හැකිය.

මුහුදේ තත්ත්වය
පොතුවිල් සිට මඩකලපුව, ත්‍රිකුණාමලය හා කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සුළඟේ වේගය පැ.කි.මී. 25-35 පමණ වෙයි.


අද කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපැල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626



අද
පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka
96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |


# මෙවර සහල් අස්වැන්න මෙට්‍රික් ටොන් 2,750,000ක්

## පරිභෝජනය සඳහා වසරකට අවශ්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,540,000ක්

## නමුත් සහල් ආනයනය කිරීමට සිදුවෙලා

### – කෘෂිකර්ම ඇමති කියයි



● නවෝද්‍යා පවනි

සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකකට වැඩි අමතර අස්වැන්නක් මෙවර ලබා ගැනීමට හැකියාව ලැබුණ නමුත්, සහල් ආනයනය කිරීමේද අවශ්‍යතාවක් මතු වී තිබෙන බව කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය.

අපට වාර්ෂිකව සහල් මෙට්‍රික් ටොන් 2,540,000ක් අවශ්‍ය බවත්, මෙවර අස්වැන්න මෙට්‍රික් ටොන් 2,750,000ක් ලබාගැනීමට හැකි වූ බවත් ඔහු සඳහන් කළේය.

තරුණ ප්‍රජාව කෘෂි කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බවද ඒ සඳහා කෘෂිකර්මය නවීකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටින බව කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය.

ඉතිහාසයේ පළමු වතාවට වගා හානි සිදු වී මාස දෙකක් ඇතුළත වන්දි ලබාදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමාටත් මුදල් අමාත්‍යාංශයටත් ප්‍රශංසාව හිමි විය යුතු බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මහතා මේ බව සඳහන් කළේ, ස්ථාවර රටකට සැවොම එක මඟකට' මැයෙන් ඊයේ (11දා) ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවට එක්වෙමිනි.

මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ අමරවීර අමාත්‍යවරයා,

"අපට වාර්ෂිකව සහල් මෙට්‍රික් ටොන් 2,540,000ක් අවශ්‍යයි. මෙවර අස්වැන්න මෙට්‍රික් ටොන් 2,750,000ක් වනවා. අප අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකකට වැඩි අමතර අස්වැන්නක් මෙවර ලබාගැනීමට හැකියාව ලැබුණා. කෙසේ වෙතත් සහල් ආනයනය කිරීමේද අවශ්‍යතාවක් මතු වී තිබෙනවා. ඊට හේතුව වී අස්වැන්න ඉහළ අගයක් ගත්තද මෝල් හිමියන් විසින් ඒවා සම්පූර්ණයෙන්ම වෙළෙඳ පොළට නිකුත් නොකිරීමයි. ඒ වගේම කීරිසම්බා අස්වැන්නේ අඩු වීමක් දක්නට ලැබුණත් සාමාන්‍යයෙන් ජනතාව පරිභෝජනය කරන සහල් වර්ගවල අඩුවීමක් සිදුව නැහැ. ඉතින් මේ උත්සව සමයේ සහල් ආනයනය නොකළා නම් සහල් මිල ශීඝ්‍රයෙන් ඉහළ යනවා. මේ නිසා අකමැත්තෙන් හෝ සහල් පිටරටින් ආනයනය කිරීමට සිදුව තිබෙනවා.

කුරුලු උණෙන් තොර රටක් ලෙස අපට කුකුළු මස් අපනයනය කිරීමට වැඩි අවස්ථාවක් තිබෙනවා. අපි දැනටමත් යම් ප්‍රමාණයක් මාලදිවයිනට අපනයනය කරනවා. අප සැලසුම වී තිබෙන්නේ, එය තවත් රටවලට ව්‍යාප්ත කිරීමට" යනුවෙන් පැවසුවේය.

# රු. 20,000ක් ඉල්ලා රාජ්‍ය සේවක වැඩවර්ජනය අද

**සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහනය වර්ජනයට නෑ**

● ඉන්දික හේවාවිතාරණ

රාජ්‍ය සේවකයන්ට ජනවාරි මාසයේ සිට රුපියල් විසිදහසක දීමනාවක් ලබාදෙන ලෙස ඉල්ලා හා තවත් ඉල්ලීම් කිහිපයක් මුල්කර ගනිමින් අද (12වැනි) දින එක්දින වැඩවර්ජනයක් සිදුකරන බව රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව සඳහන් කරයි.

මෙම වැඩ වර්ජනය සඳහා සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට සම්බන්ධ රාජ්‍ය සේවකයන් සම්බන්ධ නොවන බවද එම එකමුතුවේ කමිටු සාමාජික ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි මහතා සඳහන් කළේය.

එක්දින වැඩවර්ජනයට සමගාමීව දිස්ත්‍රික්ක 25 තුළ විරෝධතා ව්‍යාපාර 25ක් පැවැත්වීමටත් කටයුතු කරන බවත්, මේ අනුව ප්‍රධාන විරෝධතා ව්‍යාපාරය කොළඹ, බත්තරමුල්ල, සෙත්සිරිපාය ඉදිරිපිටදී පැවැත්වෙන බවත් සියලුම විරෝධතා උදෑසන 10.00ට පැවැත්වීමට කටයුතු කරන බවත් හෙතෙම පවසා සිටියේය.

වැඩවර්ජනයට සම්බන්ධ වන රාජ්‍ය සේවකයන් අද උදෑසන 8.15 සිට සවස 4.15 දක්වා කාලය තුළ අසනීප නිවාඩු වාර්තා කරන බවත්, මෙම ක්‍රියාමාර්ගයට අනුව අයවැය අවසන් වන දිනය වන 13වැනිදා රාජ්‍ය සේවක ඉල්ලීම් ලබාදීමට අදාළ යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවුණහොත් ඉල්ලීම් දිනාගන්නාතුරු විරෝධතා ව්‍යාපාර හා වැඩවර්ජන සිදුකරන බවද නියෝජ්‍ය ලේකම්වරයා සඳහන් කළේය.

මෙම ඉල්ලීම් මුල් කර ගනිමින් ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවුවහොත් අධ්‍යාපන සෞඛ්‍ය හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ පිරිස්ද වෘත්තීය ක්‍රියාමාර්ගවලට සම්බන්ධ කර ගන්නා බවත්, රුපියල් විසිදහසේ දීමනාව ලබාදීමට අමතරව ඉහළ දමා තිබෙන වැන්දඹු හා අනත්දරු අරමුදලට අයකර ගන්නා මුදල පහළ දැමිය යුතු බවත් පවසා සිටි හෙතෙම, මීට අමතරව, 2016 වසරින් පසු අහිමි කර තිබෙන පූර්ණ විශ්‍රාම වැටුප නැවත ලබාදිය යුතු බවත්, 2014 වසරේදී අහිමි කළ ශ්‍රේණි උසස් ක්‍රමය නැවත ක්‍රියාත්මක කළ යුතු බවත් පැවසීය.

# කුකුළු මස් මිල යළි නගී

## තොග මිල අද සිට රු. 1,230- 1,250 දක්වා ඉහළට

● ඉන්දික හේවාවිතාරණ

කුකුළු මස් කිලෝවක මිල අද (12) සිට රු. 30-50 අතර මුදලකින් ඉහළ දැමීමට කටයුතු කරන බව කුකුළු මස් තොග වෙළෙන්දෝ සඳහන් කරති.

බොහෝ ගොවිපළ හිමියන් විසින් සම්පූර්ණ කුකුළන් ලබා දීමෙහිදී කිලෝවකට අයකරන මුදල ඊයේ (11දා) සිට රු. 30 -50 අතර මුදලකින් ඉහළ දමා තිබෙන බව ද ඔවුහු පෙන්වා දෙති.

මේ අනුව රු. 1200කට ඊයේ අලෙවි කළ අලුත් කුකුළු මස් (ෆ්‍රේෂ් මස් ) කිලෝවක තොග මිල අද සිට රු. 1230- 1250 දක්වා ඉහළ යනු ඇති බවද සඳහන් කරති.

ඊයේ (11දා) සම සහිත කුකුළු මස් කිලෝවක් රු. 1100 -1150 අතර මිලකට අලෙවි කර තිබෙන අතර කරි චිකන් කිලෝවක් රු. 1100ක මුදලකට හා ශීත කළ කුකුළු මස් කිලෝවක් රු. 950ක මුදලකට අලෙවි කර තිබේ.

මේ අනුව ශීත කළ කුකුළු මස් කිලෝවක මිල හැර අනෙකුත් සෑම වර්ගයකම කුකුළු මස් කිලෝවක මිල රු. 30- 50 අතර මුදලකින් අද (12දා) ඉහළ යනු ඇති බවද පෙන්වා දෙයි.

රු.55කට අලෙවි කළ බිත්තරයක මිල ඊයේ (11දා) දිනයේදී රු. 60ක් දක්වා ඉහළ දැමීමට කටයුතු කර තිබෙන අතර ඉල්ලුමට සරිලන සැපයුම නොලැබීම නිසා බිත්තර මිල ඉහළ යමින් තිබෙන බවද තොග වෙළෙන්දෝ සඳහන් කරති.

කුකුළු මස් හා බිත්තර මිල ඉහළ දැමීම ව්‍යාපාරිකයන් විසින් සිදුකරන ජාවාරම් ක්‍රියා නිසා සිදුවන බවත්, මේ නිසා බලධාරීන් මේ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කළ යුතු බවත් ජාතික පාරිභෝගික පෙරමුණ සඳහන් කරයි.

ඉදිරියේදී උත්සව සමය ආරම්භ වන බවත්, ඒ සඳහා ජනතාව මේ වන විට සූදානම් වෙමින් තිබෙන බවත්, පවතින තත්වය සැලකිල්ලට ගෙන බොහෝ භාණ්ඩ මිල මේ වන විට අසාධාරණ ලෙස ඉහළ දමා තිබෙන බවත් එම පෙරමුණේ සභාපති අසේල සම්පත් මහතා සඳහන් කළේය.




# 2024 ජනවාරි 01දා සිට 18%ක වැට් එන භාණ්ඩ හා සේවා

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වී ඇති නිසා 2024 ජනවාරි මස 01දා සිට භාණ්ඩ හා සේවා 97ක් සඳහා 15%ක්ව පැවති වැට් බදු 18%ක් දක්වා ඉහළ දැමීම ක්‍රියාත්මක වනු ඇත.

ආහාර, ආහාර නොවන, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා, සාමාජයීය කරුණු සහ වෙනත් ලෙස මෙම වැට් බදු අය කිරීම සිදු වෙයි.

එහිදී වැට් නැවත පනවන ලද භාණ්ඩ හා සේවා 97ට අයත් අයිතමයන් පහත පරිදි වේ.

ඒ අනුව ආහාර යටතේ මෙරට තුළ වගා කෙරෙන ධාන්‍ය මඟින් නිපදවන ආහාර නිෂ්පාදන, දේශීයව නිපදවන පොල් කිරි යනාදිය වෙත මෙම වැට් බද්ද බලපැවැත්වෙයි.

එසේම ආහාර නොවන කාණ්ඩය යටතේ ලොරි, ට්‍රක්, බස් රථ, ක්‍රීඩා උපකරණ, රබර් හෝ ප්ලාස්ටික් නිෂ්පාදන නිපදවන යන්ත්‍ර, ඇස් කණ්ණාඩි සහ ඇස්කණ්ණාඩි රාමු සඳහා වන අමුද්‍රව්‍ය, කුකුළු ගොවිපොළ සඳහා වන උපාංග, බවුසර, බුල්ඩෝසර ඇතුළු ඉදිකිරීම් යන්ත්‍ර, අපද්‍රව්‍ය රැගෙන යන ට්‍රක් රථ, බලශක්තිය ඉතිරි කරන විදුලි බල්බ, එම බල්බ නිපදවීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය, ජංගම දුරකථන, ආනයනය කෙරෙන සහ නිපදවන එතිල් ඇල්කොහොල් නිෂ්පාදන යනාදිය අයත් වෙයි.

සෞඛ්‍ය කාණ්ඩය යටතේ ඉහළ තාක්ෂණික වෛද්‍ය උපකරණ, සෞඛ්‍ය ආරක්ෂක උපකරණ, වෛද්‍ය යන්ත්‍රෝපකරණ හෝ ඕනෑම ගිලන් රථ, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකරන ඖෂධ සහ ආයුර්වේද ඖෂධ ඇසුරුම් කිරීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකරන ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර සහ ඒවායේ අමතර කොටස් යනාදිය ඇතුළත්ව තිබේ. එසේම කෘෂිකර්මාන්ත කාණ්ඩය යටතේ ඉස්සන් නිෂ්පාදනය, ධීවර කර්මාන්තය සඳහා යොදා ගන්නා ඇම, බිජු පිති හා සම්බන්ධ උපාංග ඇතුළු දෑ, දේශීයව නිපදවන පොල් තෙල්, පොල් කෙඳි, වගා මාධ්‍ය, ඇඹරුම් කෙඳි හෝ පොල් ලෙලි යනාදී පොල් කර්මාන්තයේ ඉවත ලන දෑ සඳහා, දේශීයව නිපදවන කිරි නිෂ්පාදන, දේශීයව නිපදවන සහල්, කුකුළු ගොවිපොළ සඳහා වන යන්ත්‍ර සහ උපකරණ, අභිජනයය සඳහා ආනයනය කෙරෙන ගවයන්, මීගවයන්, කුකුළන්, ඌරන්, එළුවන්, බැටලුවන් ඇතුළත් වෙයි.

කර්මාන්ත කාණ්ඩය යටතේ ස්වාභාවික හෝ කෘත්‍රිම පබලු, දියමන්ති වටිනා හෝ අර්ධ වටිනාකමක් සහිත පාෂාණ, දියමන්ති කුඩු, වටිනා ලෝහ, රන් කාසි, පොත්, සඟරා, පත්‍රිකා හෝ වාර සඟරා (පුවත්පත් නොවන), ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගන්නා උපකරණ, කිරි නිෂ්පාදන යන්ත්‍ර, පරිගණක සහ පරිගණක උපාංග, රෙදිපිළි නිෂ්පාදනය සඳහා යොදා ගන්නා උපකරණ සහ නූල්, සහල් මෝල් කර්මාන්තය සඳහා වන යන්ත්‍ර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් පිටතදී රුපියල් මිලියන තිහක මූලික ප්‍රාග්ධනයක් සහිතව ආරම්භ කරන සමාගම්, මාධ්‍ය උපකරණ, ධාන්‍ය මිශ්‍රිත බේකරි නිෂ්පාදන සඳහා වන යන්ත්‍රෝපකරණ, හම් ආශ්‍රිත බෑග්, පාවහන් නිෂ්පාදන යන්ත්‍ර, ටැක්සි මීටර්, කෘෂිකාර්මික යන්ත්‍ර සහ උපාංග, විදුලි උපාංග, විලාසිතා ආභරණ සහ පලතුරු බීජ නිෂ්පාදන යන්ත්‍ර, පුනර්ජනනීය බලශක්ති උත්පාදන යන්ත්‍ර සහ උපාංග, දේශීයව නිපදවුණු සීනි, දේශීයව නිපදවුණු ආභරණ, දේශීයව නිපදවන ජල විදුලි හෝ සුළං විදුලි යන්ත්‍ර සහ උපාංග, ටර්බයින, ටින් කළ මාළු හෝ දේශීය අමුද්‍රව්‍ය යොදා ගෙන නිපදවූ මැටි භාණ්ඩ, දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන සංචාරක හෝටල් සඳහා විශේෂයෙන් නිපදවන භාණ්ඩ, දේශීය වෙළෙඳ පොළ සඳහා දේශීයව නිපදවන රෙදිපිළි, ආනයනික බට පතුරු, ජෛව ස්කන්ධ අපද්‍රව්‍ය සඳහා යොදා ගන්නා දේශීයව නිපදවන සම්පීඩිත ගල් අඟුරු හෝ පැළැට්, දේශීයව නිපදවන මෘදුකාංග, දේශීයව නිපදවන පාම් තෙල්, දේශීයව නිපදවන දිසිදි පොල්, රබර්, ලේටෙක්ස්, තේ, බිත්තර, දියරමය කිරි, තොරතුරු තාක්ෂණික සහ ඊට අදාළ සේවා, ලංකා විදුලි බල මණ්ඩලය සඳහා වන ඕනෑම යන්ත්‍ර හෝ උපකරණ, පාවහන් නිෂ්පාදන කර්මාන්තයට යොදා ගන්නා සැකසූ හම්, තඹ ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොදා ගන්නා තඹ පත්‍ර, වර්ණක, පැරෆින් වැක්ස් යනාදිය. පොදු පුස්තකාල සේවා, ඕනෑම යාත්‍රාවක් මඟින් ලබා දෙන සේවාවක්, සිතුවම් නිර්මාණ අලෙවි කිරීමේ, ඒකකභාර කළමනාකරණ සමාගම් මඟින් ලබා දෙන සේවා, මෙරටට පැමිණෙන ක්‍රීඩා ඉසව් සංවිධායකයන්, ක්‍රීඩකයන් වෙත ලබා දෙන හෝටල් පහසුකම් යනාදිය ඇතුළත් වෙයි.

මීට අමතරව අනෙකුත් කාණ්ඩය යටතේ බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය සඳහා වන ඕනෑම සිනමාපටයක්, ඕනෑම සිනමාපටයක් නිෂ්පාදනය සඳහා නව රසයානාගාර පහසුකම්, රුපියල් දසදහසකට වඩා ඉහළ වටිනාකමක් නොගන්නා සමාගමක් වෙත තැපැල් මඟින් හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා හරහා රැගෙන එන පෞද්ගලික අයිතම හෝ සාම්පල, මෙරට තුළ නිපදවන හෝ තවදුරටත් මුද්‍රණ හෝ අනෙකුත් කටයුතු සඳහා විදෙස් රටවලට යවන ඕනෑම සිනමාපටයක්, සිනමාපට කර්මාන්තය සඳහා අදාළ උපකරණ යනාදිය ඇතුළත් වෙයි.

# වැට් බද්ද සම්මතයි

## පක්ෂව 100 විපක්ෂව 55

● දිනේෂ් සමරකෝන්

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත්කෙටුම්පත තෙවැනි වර කියවා වැඩි ඡන්ද 45න් සම්මත වූ බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඊයේ (11දා) පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය.



එහිදී පක්ෂව ඡන්ද 100ක් ලැබුණු සහ විපක්ෂව ඡන්ද 55 ලැබුණු අතර, ඡන්ද විමසීම සිදුව අවස්ථාවේ මන්ත්‍රීවරු 69ක් සභා ගර්භයේ නොසිටියහ.

මේ අතර එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම වැඩි ඡන්ද 57න් සම්මත විය. එහිදී පක්ෂව ඡන්ද 98ක් සහ විපක්ෂව ඡන්ද 41ක් ලැබුණු අතර, ඡන්ද විමසීම සිදුවන අවස්ථාවේ මන්ත්‍රීවරු85ක් සභා ගර්භයේ නොසිටියහ.

මෙම අවස්ථා දෙකෙහිදීම නිමල් ලංසා, ජෝන් සෙනවිරත්න, අනුර ප්‍රියදර්ශන යාපා, එච්.එල්.එම්. අතාවුල්ලා, ප්‍රියංකර ජයරත්න මෙන්ම සමගි ජන බලවේගය නියෝජනය කරන වඩිවෙල් සුරේෂ් පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය භාවිත කළහ.

මේ අතර ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී රොෂාන් රණසිංහ මහතා අවස්ථා දෙකෙහිදීම පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය භාවිත කළේය.

මෙහිදී සමගි ජන බලවේගය, ජාතික ජන බලවේගය මෙන්ම ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරන මන්ත්‍රීවරු පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය භාවිත කළහ. කෙසේ වෙතත් ඡන්ද විමසීම සිදුවන අවස්ථාවේ දෙමළ ජාතික සන්ධානය සභා ගර්භයේ නොසිටියහ.

එමෙන්ම හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, චමල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ යන මන්ත්‍රීවරුන්ද සභා ගර්භයේ නොසිටියහ.

මේ අතර පළමු අවස්ථාවේ ඡන්ද විමසීමේදී ඡන්ද විමසීමෙන් පසුව පැමිණි අසංක නවරත්න මන්ත්‍රීවරයාට ඡන්ද විමසීමට අවස්ථාව නොදුන් අතර, පසුව දෙවැනි අවස්ථාවේදී ඔහු ඡන්දය භාවිත කළේය.

ඒ අනුව එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත වැඩි ඡන්දයෙන් පාර්ලිමේන්තුවේදී ඊයේ (11දා) සම්මත විය.

එකතු කළ අගය මත බදු සංශෝධනයට අදාළ විවාදය මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා විසින් ආරම්භ කළ අතර, එහිදී මේ සඳහා විවාදයක් අවශ්‍ය නොවන බව අමාත්‍යවරයා සඳහන් කළේය.

මේ සඳහා විශේෂ විවාදයක් පෙරේදා (10දා) ලබාදුන් බවත්, සන පූර්ණය නොමැති බව සඳහන් කරමින් විපක්ෂය විසින් එම විවාදය කඩා කප්පල් කළ බැවින් මේ සඳහා විවාදයක් අවශ්‍ය නොවන බව ඇමතිවරයා පැවසීය.

විපක්ෂයට ලබාදුන් අවස්ථාව විපක්ෂය විසින් ලබා නොගත් බැවින් මේ සඳහා විවාදයක් අවශ්‍ය නොවන බවත්, එබැවින් ඡන්ද විමසීම සිදුකළ යුතු බවත් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා සඳහන් කළේය.

ඒ අනුව මීට සවස 5.00ට පමණ විපක්ෂයේ දැඩි විරෝධය මධ්‍යයේ ඡන්ද විමසීම සිදුකිරීම සඳහා වන සීනුව නාද කිරීමට කථානායකවරයා නියෝග කළේය. ඒ අනුව මීට අදාළ ඡන්ද විමසීම සිදුවිය.

